**නින්දවූර් ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

---------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන .**

**1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 22 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 03 දින ඉදිරිපත් කරන ලදි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2011 නොවැම්බර් 15 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .**

**1.2 . මතය .**

**මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ නින්දවූර් ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර පිළියෙල, 2010 දෙසැම්බර් 31 දිනට නින්දවූර් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.**

**1.3 . මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම .**

**1.3.1 . ගිණුම්කරණ ප්‍රතිපත්ති .**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .**

**( අ ) උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර නොතිබුණි .**

( ආ ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

**1.3.2 . ගිණුම්කරණ අඩුපාඩු .**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) වටිනාකම රු . 140,704 ක් වූ විදුලි උපකරණ තොගය , භෞතිකව සමීක්ෂණය නොකොට , පොත් අගය මත ගිණුම් වල දක්වා තිබුණි .

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172(2) වගන්තිය ප්‍රකාරව ගිණුම් වල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

(ඇ) සභාවේ ඉඩම් සහ ගොඩනැගිලි වල අගය තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි .

(ඇ) සමුච්චිත අරමුදලේ 2010 වර්ෂය සඳහා වූ ආරම්භක ශේෂය ගිණුම් වල රු . 167,811 කින් අඩුවෙන් දක්වා තිබුණි .

**1.3.3 ගෙවිය යුතු ගිණුම් .**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අධික කාලයක් ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් වල වටිනාකම රු . 1,700,571 ක් විය .

**1.3.4 . අනුකූල නොවීම් .**

පහත සඳහන් නීති , රීති . රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය .

| නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | අනුකූල නොවීම් . |
| --- | --- |
| ( අ ) ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති - 1988 . | |

| | | | |
|---|---|---|---|
| | රීති අංක 180 | - | මුදල් සහ ගබඩා පරිහරණය කරන නිලධාරින් විසින් ආරක්ෂක ඇප තැන්පත් කර නොතිබුණි . |
| | රීති අංක 217 | - | සභාව පීඑස් 46 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි . |
| | රීති අංක 218 | - | සුදුසු නිලධාරියෙකු විසින් ඉඩම් සහ ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි . |
| | රීති අංක 219 | - | රීතිය මගින් නියම කර ඇති පරිදි ඉඩම් සහ ගොඩනැගිලි සඳහා වෙනම ලේඛණයක් , විස්තරාත්මක ලැයිස්තු සහ සමීක්ෂණ වාර්තා පවත්වා නොතිබුණි . |
| (ආ) | 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ 153 වගන්තිය | - | රු. 31,977 ක් වූ රඳවුම් බදු අඩු නොකොට ගෙවිම් සිදුකර තිබුණි . |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය .

## 2.1 මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 5,608,008 ක් වූ අතර එයට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු . 237,763 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය .

### 2.2.1 . ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 1,000 | 411 | 3,830 |
| (ii) | බදු කුලී | 3,469 | 3,484 | 3,332 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 600 | 486 | - |
| (iv) | වෙනත් ආදායම් | - | - | - |

**2.2.2 .** උසාවි දඩ .

කල්මුනේ මහේස්ත්‍රාත් උසාවිය මගින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකරන ලද රු . 253,650 ක් වූ උසාවි දඩ ලබාගෙන පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි .

**2.2.3 .** මුද්දර ගාස්තු .

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි .

**2.3 .** වියදම් ව්‍යුහය .

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත වියදම , තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ .

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | |
| | රු . ' 000 | රු . ' 000 | රු . ' 000 |
| පෞද්ගලික පඩිනඩි | 17,699 | 10,529 | 7,170 |
| වෙනත් | 26,609 | 10,020 | 16,509 |
| උප එකතුව | 44,308 | 20,549 | 23,758 |
| ප්‍රාග්ධන වියදම් | 14,500 | 10,165 | 4,335 |

| | | | |
|---|---|---|---|
| මුළු එකතුව | **58,808** | **30,714** | **28,094** |
| | ======= | ======= | ====== |

**2.4 . මානව සම්පත් කළමනාකරණය .**

**අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය .**

**2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ .**

| තනතුරු වර්ගය . | අනුමත . | තථ්‍ය . |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | 01 |
| ද්විතියික ශ්‍රේණිය | 05 | 12 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 13 | 11 |
| වෙනත් | - | 18 |
| | 19 | 42 |

**2.5 . කොන්ත්‍රාත් පරිපාලනය**

**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය**

**පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දිර්ඝ ප්‍රමාදයන් නිරික්ෂණය විය .**

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු | ආරම්භක | නිම කිරිම | 2010 දෙසැම්බර් | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|

| | ගත පිරිවැය | දිනය | අපේක්ෂිත දිනය | 31 දක්වා වියදම | |
|---|---|---|---|---|---|
| කාර්යාල ගොඩනැගිලි | 4,867,840 | 2009.08.12 | 2010.02.12 | 973,251 | පළාත් පාලන කොමසාරිස්වරයා විසින් තාවකාලිකව අත්හිටුවා ඇත. |

**2.6 අභ්‍යන්තර විගණනය**

ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .

**3 . පද්ධති හා පාලන .**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ .

( අ ) ගිණුම්කරණය .

( ආ ) ස්ථාවර වත්කම් පාලනය .

( ඇ ) ආදායම් පරිපාලනය .